(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 7.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2018 නොවැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 ට**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 1/'18

1.

ගරු නවීන් දිසානායක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා,— ජනරජයේ අරමුදල්වලින් කවර හෝ වියදම් අනුමත කිරීම සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බව,— 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත කර ගන්නා ලද ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවේ 2 වැනි ඡේදයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති බවට කථානායකවරයා විසින් 2018 නොවැම්බර් 15 වැනි දින කරන ලද නිල ප්‍රකාශය මෙම සභාව 2018 නොවැම්බර් 16 වැනි දින පිළිගත් හෙයින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාවේ අරමුණු කොට ඇති පරිදි 2018 ඔක්තෝබර් 26 වැනි දින සිට ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බවට මෙම සභාව තවදුරටත් යෝජනා සම්මත කරගත් හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පරිදි රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු හෙයින් ද;

ඊට අනුකූලව, 2018 නොවැම්බර් 15 වැනි දින සිට ජනරජයේ අරමුදල් වෙතින් කිසිදු වියදමක් අනුමත කිරීමට අග්‍රාමාත්‍ය ලේකම්වරයාට කිසිදු බලයක් නොමැති බවටත්, මෙම යෝජනා සම්මතය උල්ලංඝනය කරමින් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා කවර හෝ තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගනු ලබනු ඇති බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.